# යථාර්ථවාද

යථාර්ථවාදි රීතිය යනු ඇති සැටි ඇති සැටියෙන් කියන්න යැයි සරලව කිව හැකි ය. එහෙත් මෙහි දී ඇත්ත යනු කුමක් ද යන ප්‍රශ්නයට එකම නිශ්චිත පිළිතුරක් සාහිත්‍යයෙහි තබා කිසිම විද්‍යාවකවත් දැකිය නො හැකිය. එයට හේතුව යථාර්ථය යනු කුමක් දැයි ප්‍රවාදයකින් තොරව ප්‍රකාශකිරීමට ඇති නො හැකියාව ය. ඒ ඒ ප්‍රවාදය අනුව යථාර්ථය යන්න ද වෙනස් වෙයි! එවිට යථාර්ථයක් ඇත්තේ කොහේ ද, යථාර්ථය හැඳිනගන්නේ කෙසේ ද ආදී ප්‍රශ්නවලට පිළිතුරක් දිය නො හැකි ය.

සාහිත්‍යයේ යථාර්ථවාදී රීතියක් ගැන මෙන් ම සමාජ සත්තා යථාර්ථයක් ගැන ද කියැවෙයි. යථාර්ථවාදී රීතියට අමතර ව සමාජ සත්තා යථාර්ථයක් කුමකට ද? මේ දෙකෙන් වඩා යථාර්ථවාදී කුමක් ද? දෙක ම යථාර්ථවාදී ද? නැත්නම් එකක් පමණක් යථාර්ථවාදී ද? එසේත් නැතහොත් එකක්වත් යථාර්ථවාදී නො වේ ද? සාහිත්‍යකරුවන් මෙවැනි ප්‍රශ්න සාකච්ඡාකර ඇත් දැයි නො දනිමි.

ඉහත සඳහන් යථාර්ථ දෙක පිටුපස ඇත්තේ දේශපාලනය ය. යථාර්ථවාදී රීතිය බටහිර ධනපති ක්‍රමය තුළ පැන නැගුණේ වෙයි. එය බටහිර විද්‍යාව අනුව යමින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මත පදනම් වෙයි. එහි දී යථාර්ථය හඳුනාගන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නිර්මාණය වී ඇති ප්‍රවාද පදනම් කරගනිමිනි. එහෙත් ප්‍රශ්නයක් වෙයි. බටහිර භෞතික විද්‍යාව විසින් සඳහන්කෙරෙන ඊනියා යථාර්ථය හෝ ජීව විද්‍යාව විසින් ඉදිරිපත්කෙරෙන ඊනියා යථාර්ථය හෝ සාහිත්‍යයෙහි දී යොදාගැනෙනනේ කෙසේ ද?

බටහිර සාහිත්‍යයෙහි ඇත්තේ ඊනියා සමාජ යථාර්ථයකි. ඒ ඊනියා සමාජ යථාර්ථය කියැවෙන්නේ බටහිර සමාජීය විද්‍යාවෙහි (sociology) ය. මෙයින් කියැවෙන්නේ සාහිත්‍යකරුවන් පළමුවෙන් බටහිර සමාජ විද්‍යාව හැදෑරිය යුතු ය යන්න නො වෙයි. බටහිර සමාජ විද්‍යාව නො හැදෑරුව ද එහි ඉගැන්වෙන, එනම් ඉන් විස්තර කෙරෙන සමාජ යථාර්ථය කෙසේ හෝ සාහිත්‍යකරුවාට කාන්දුවන බව මෙයින් දළ වශයෙන් හැඳින්වෙයි.

අනෙක් අතට මාක්ස් - ට්‍රොට්ස්කිවාදින්ගෙන් ඇසුවහොත් ඔවුන් කියනු ඇත්තේ යථාර්ථය ඇත්තේ මාක්ස් ලෙනින් ට්‍රොට්ස්කි ආදීන්ගේ කෘතිවල බව ය. ඒ යථාර්ථය හා බටහිර සමාජ විද්‍යාවෙන් ප්‍රකාශවන යථාර්ථය එකක් ම ද? (මාක්ස් - ට්‍රොට්ස්කිවාදීන් විශ්වාස නො කළ ද, ලෙනින්ගේ ප්‍රවාද මාක්ස් - ට්‍රොට්ස්කිවාදයෙන් වෙනස් වෙයි. වැඩි විස්තර සඳහා මාක්ස්වාදයේ දරිද්‍රතාවය කියවන්න.) බටහිර සමාජ යථාර්ථය අනුව සමාජවාදී හෝ කොමියුනිස්ට් හෝ සමාජයක් බිහිවිය නො හැකි ය. එහෙත් මාක්ස් - ට්‍රොට්ස්කිවාදයෙහි සමාජවාදයක් බිහිවීම අනිවාර්ය වෙයි. එසේ වුවත් ඒ සමාජවාදය බිහිකරගැනීම සඳහා තිබිය යුතු ඊනියා කම්කරු පංති නායකත්වය ඇතිකරගන්නේ කෙසේ ද යන්න එහි දී ප්‍රශ්නයක් වෙයි.

සමාජ සත්තා යථාර්ථය ලෙනින් - ස්ටැලින්වාදීන්ගේ යථාර්ථවාදය මත පදනම් වෙයි. මේ යථාර්ථයට අනුව තනි රටක සමාජවාදයක් ඇතිවිය හැකි ය. එපමණක් නොව දැනට ටික කලකට පෙර සෝවියට් රුසියාව කඩා වැටීමට පෙර එහි හා ඇතැම් නැගෙනහිර යුරෝපීය රටවල කොමියුනිස්ට්වාදී රටවල් විය. එමෙන් ම දෙවැනි ලෝක යුද්ධය නමින් හැඳින්වෙන යුද්ධයට පෙර සෝවියට් රුසියාව නම් රටෙහි පමණක් වුව ද කොමියුනිස්ට් රාජ්‍යයක් තිබිණි.

එහෙත් මාක්ස් - ට්‍රොට්ස්කිවාදීන්ට අනුව එලෙස දිගින් දිගට බටහිර යුරෝපයේ රටවල කොමියුනිස්ට් රාජ්‍යය ඇති නො වී කොමියුනිස්ට් හෝ සමාජවාදී හෝ රටවල් පැවතිය නො හැකි ය. එබැවින් බටහිර යුරෝපයේ රටවල කොමියුනිස්ට් රාජ්‍ය බිහිකිරීම සමාජවාදීන්ගේ වැදගත් කාර්යභාරයක් වෙයි. එවැනි සමාජ බිහිවීම ඉතිහාසයේ විකාශයට අනුව අනිවාර්යයෙන් ම සිදුවිය යුතු යැයි මුල් මාක්ස්වාදයෙන් කියැවෙයි. එහෙත් එසේ බිහිවන්නේ ඊනියා කම්කරු පංති නායකත්වයකින් බව ද ප්‍රකාශ වෙයි. කම්කරු පංතිය ඊනියා විප්ලවය සාක්ෂාත් කරගන්නේ කම්කරු පංති පක්ෂය ඔස්සේ බව ද ඉන් ගම්‍ය වෙයි.

© Prof. Nalin De Silva

මේ කම්කරු පංති පක්ෂය ගොඩනගාගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය විවිධාකාර මාක්ස්වාදී පක්ෂවල දිගින් දිගට සාකච්ඡා වී ඇත. එමෙන් ම සමාජවාදී විප්ලවය සමාජ විකාශයට අනුව අනිවාර්යවීම පිළිබඳ ප්‍රශ්නය ද බොහෝ දෙනාගේ අවධානයට යොමු වී ඇත. අද පශ්චාත් මාක්ස්වාදීන් යනුවෙන් හැඳින්වෙන්නන් (මෙරට සිටින අනුකාරකයන් නො වෙයි. අනුකාරකයන්ට කළ හැක්කේ බටහිර පශ්චාත් මාක්ස්වාදීන්ගේ මත සිංහලෙන් කීම හා ලිවීම පමණකි.) අතර සාකච්ඡාවන ප්‍රධාන ප්‍රශ්න මේ විප්ලවයේ අනිවාර්යභාවය වටා ගෙතී ඇත. අනුකාරකයන් පශ්චාත් මාක්ස්වාදය යන්න මෙරටට හඳුන්වාදෙනු ලැබීමට ප්‍රථම මේ ඇතැම් ප්‍රශ්න මාක්ස්වාදයේ දරිද්‍රතාවය කෘතියෙහි සාකච්ඡා කෙරී ඇත.

ඒ කෙසේ වෙතත් අද වන විට සෝවියට් දේශයවත් නැගෙනහිර යුරෝපයේ අනෙක් කොමියුනිස්ට් රාජ්‍යවත් ආසියාවේ චීන කොමියුනිස්ට් රාජ්‍යයවත් දක්නට නැත. ලෙනින් - ස්ටැලින්වාදයට තනි රටක තබා නැගෙනහිර යුරෝපයේවත් ආසියාවේ ඇතැම් රටවලවත් සමාජවාදයක් ගොඩනගාගැනීමට නොහැකි වී ඇත. අද යාන්තමින් ඉතිරි වී තිබෙන ඊනියා කොමියුනිස්ට් රාජ්‍යය කියුබාව ය. එහෙත් කස්ත්‍රෝ මහතාගේ මරණයෙන් ටික කලකට පසුව කියුබාවේ කොමියුනිස්ට් රාජ්‍යය ද අභාවප්‍රාප්ත වීමට නියමිත ව ඇත. ලෙනින්, ස්ටැලින්, මා ඕ, ටිටෝ, හෝ චී මිං, කස්ත්‍රෝ ආදී පුද්ගලයන් මත ගොඩනැගී අභාවයට ගිය හා යන රාජ්‍යවල පුද්ගල සාධකය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් පශ්චාත් මාක්ස්වාදීන් (මෙරට අනුකාරකයන් නොව) විසින් හෝ කෙරී ඇතැයි නො සිතමි.

කියුබාව හැරෙන්නට ලෝකයේ බිහි වූ අනෙක් කොමියුනිස්ට් රාජ්‍ය අභාවයටයෑමෙන් කියැවෙන්නේ මාක්ස් - ට්‍රොට්ස්කිවාදය නිවැරදි බව ද? බටහිර යුරෝපයේ රටවල කොමියුනිස්ට් රාජ්‍ය බිහි නොවී වෙනත් කිසිම රටක හෝ රටවල් කිහිපයක හෝ සමාජවාදී රාජ්‍ය බිහිවිය නො හැකි ද? එහෙත් එයට වඩා වැදගත් ප්‍රශ්නයක් වෙයි. ඓතිහාසික භෞතිකවාදයෙහි (Historical Materialism) ප්‍රවාදවලට අනුව බටහිර යුරෝපයෙහි කම්කරු පංති විප්ලවය අනිවාර්ය වුවත් ඒ නොසිදුවන්නේ ඇයි? ඉතා ම සුපිරි ගණයේ ට්‍රොට්ස්කිවාදීන්ට වුව ද මොන තරම් වලිකෑවත් අද බටහිර යුරෝපයෙහි සමාජවාදී රාජ්‍යයක් නොව කොමියුනිස්ට්වාදී රාජ්‍යයක්වත් බිහිකරගත නො හැකි ය.

බටහිර විද්‍යාවේ සම්ප්‍රදාය අනුව නම් විවිධ මාක්ස්වාදී ගුරුකුල විසින් බිහිකෙරී ඇති ප්‍රවාද අදවන විට ඉතිහාසයේ කුණුකූඩය හිමිකරගත යුතු ව ඇත. එහෙත් මළ මිනියක් බෙහෙත් ගල්වා තබාගැනීමට කරන වෑයමක් මාක්ස්වාදය සම්බන්ධයෙන් ගත්කල අද ඊනියා පශ්චාත් මාක්ස්වාදයෙහි දක්නට ඇත. මාක්ස්වාදී ගුරුකුල කෙතරම් විද්‍යාවක් ගැන කතාකළ ද, බටහිර භෞතික විද්‍යාව අනුකරණයකිරීමට තැත්කළ ද, ඒ ගුරුකුලවාදීන්ට බටහිර භෞතික විද්‍යාව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ කිසිම අවබෝධයක් නැති බව පැහැදිලි ය.

යථාර්ථය යනුවෙන් අපෙන් තොරව, එනම් අපේ මනසින් තොරව පවත්නා දෙයක් නැත යන්න මේ ඊනියා යථාර්ථවාදවලින් ද පැහැදිලි වෙයි. ඒ ඒ අයගේ යථාරාථය ඒ ඒ අය විසින් තමන් විශ්වාසකරන ප්‍රවාද මත ගොඩනැගෙයි. බටහිර සාහිත්‍යයෙහි සාමාන්‍යයෙන් කියැවෙන යථාර්ථවාදයෙහි සමාජවාදයක් බිහිවීමක් ගැන සඳහන් නො වෙයි. සමාජවාදයක ඉඟියක් පවා ඒ ඊනියා යථාර්ථයෙහි තිබිය නො හැකි ය. ෆුකුයාමා මහතා වැනි බටහිර ධනවාදී ලිබරල්වාදියකුට අනුව සමාජ විකාශයෙහි අග්‍රඵලය බටහිර ලිබරල්වාදී සමාජ වෙයි. ඔහුට අනුව බටහිර ලිබරල්වාදී රාජ්‍යයෙන් ඔබ්බට සමාජය තවදුරටත් විකාශය නො වෙයි. ෆුකුයාමා මහතාට අනුව දැන් ඉතිහාසය අවසන් ය. ඔහුට අනුව අප සමාජ විකාශයෙහි අවසාන අදියර සාක්ෂාත්කරගෙන අවසන් ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා අයත්වූයේ කිනම් ගුරුකුලයකට ද? ඒ මහතා සාහිත්‍යකරුවකු ලෙස යථාර්ථවාදියකු වී ද? එසේත් නැත්නම් සමාජ සත්තා යථාර්ථවාදියකු වී ද? මෙහි දී අප මතක තබාගත යුතු කරුණක් වෙයි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා බටහිර සාහිත්‍ය විචාරය ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදීමේ දී (මේ සිංහල පාඨකයා ට ඒ ඒ ගුරුකුල හා ප්‍රවාද හඳුනාගැනීම හැරෙන්නට වෙන වැඩක් නැත.) යථාර්ථවාදයක් ගැන නො කීවේ ය. ඔහු සඳහන් කෙළේ තාත්විකවාදයක් ගැන ය. පසුකලෙක යථාර්ථවාදීන්ගෙන්, විශේෂයෙන් ම මාක්ස් ට්‍රොට්ස්කිවාදි යථාර්ථවාදින්ගෙන් ඒ මහතා බැට කෑවේ ඔවුන්ට අනුව තාත්විකවාදය යථාර්ථවාදයක් නොවුණු බැවින් ය.

© Prof. Nalin De Silva

තාත්විකවාදයෙහි ප්‍රශ්නය බැලු බැල්මට ප්‍රවාදයක් නොමැති වීම ය. මාක්ස් ට්‍රොට්ස්කිවාදීන්ගේ යථාර්ථය ප්‍රවාද මත පදනම් වෙයි. එහෙත් තාත්විකවාදයෙහි බැලු බැල්මට ප්‍රවාද නැත. එහි දී ලෝකය සැබෑ ආකාරයෙන් විස්තර කෙරෙයි. මෙහි දී සිදුවන්නේ ඉන්ද්‍රිය ගෝචර ආකාරයෙන් ලෝකය විස්තර කිරීම ය. චරිතවලට අද්භූතවාදි ලක්ෂණ ආරෝපණය නොකර කෙරෙන විස්තරයක් ගැන තාත්විකවාදයෙහි කියැවෙයි. පැහැදිලිකිරීම සඳහා ඉතා සරල උදාහරණයක් ලෙස ගතහොත් අපට නවකතාවක හෝ කෙටිකතාවක හෝ පියාඹන හෝ අහසින් යන හෝ මිනිසුන් දැකගත නො හැකි ය.

එහෙත් මෙය ප්‍රවාදයකින් තොර වූවක් නො වෙයි. අහසින් යන මිනිසුන් බටහිර භෞතික විද්‍යාවෙන් මෙන් ම බටහිර ජීව විද්‍යාවෙන් ද ප්‍රතික්ෂෙප වෙයි. එහෙත් ආගම්වල එවැන්නන් මුළුමනින් ම ප්‍රතික්ෂෙප නො වෙයි. අද්භූතවාදී රීතියක ගොඩනැගුණු කතාවක අහසින් යන මිනිසුන් සිටිය හැකි ය. එහෙත් ඒ බටහිර විද්‍යාවන් සමග එකග නො වෙයි. ජාතකකතාවල කතාකරන සත්තු වෙති. එහි ඒ ඒ වර්ගයේ සතුන් අතර පමණක් නොව විවිධ වර්ගවල සතුන් අතර ද  කතාබහ සිදුවෙයි. බක ජාතකයෙහි කොකා මාළු සමග කතාකරයි. මේ කතාකිරීම වත්මන් බටහිර ජීව විද්‍යාව සමග එකග නො වෙයි.

තාත්විකවාදයෙහි ද එලෙස එකිනෙකා සමග සන්නිවේදනය කරගන්නා සත්තු නො වෙති. එයට හේතුව අප දන්නා බටහිර ජීව විද්‍යාවේ ප්‍රවාදවලින් ඒ ප්‍රතික්ෂෙප වීම ය. එබැවින් තාත්විකවාදයෙහි ප්‍රවාද නැතැයි කිව නො හැකි ය. මට තේරෙන අයුරින් තාත්විකවාදය ඊනියා යථාර්ථවාදවලින් (යථාර්ථවාද රාශියක් ඇති බව පැහැදිලි විය යුතු ය. එහෙත් යථාර්ථයක් යනුවෙන් දෙයක් ඇත්නම් තිබිය හැක්කේ එක් යථාර්ථයක් පමණකි!) වෙන්වන්නේ මොනයම් හෝ ප්‍රවාද නැතිකමින් හෝ වෙනත් එවැනි හේතුවකින් හෝ නොවේ. තාත්විකවාදයෙහි වියුක්ත ප්‍රවාද නොමැතිවීමෙන් ඒ ඊනියා යථාර්ථවාදවලින්  වෙනස්වන්නේ යැයි සිතමි. වෙනස සංයුක්තය හා වියුක්තය අතර ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva